ප්‍රංශ ජනපති එම්මානුවෙල් මැක්‍රොන් විසින් ප්‍රංශයේ අභිනව අගමැතිවරයා ලෙසින් ගේබ්‍රියල් අතාල් නම් කිරීමත්, ඔහු නූතන ප්‍රංශ ඉතිහාසයේ ලාබාලතම අගමැතිවරයා වීමත් දෙස් විදෙස් මාධ්‍ය වාර්තා කරයි. ප්‍රංශයේ නව අගමැති ලෙසින් නම් වූ ගේබ්‍රියල් අතාල් විවෘතවම තමන්ගේ ලිංගික නැඹුරුතාවය සමරිසි බව සඳහන් කරන්නේ යැයි ද ඇතැම් ජාත්‍යන්තර මාධ්‍ය තුළ පවා සඳහන් වේ (BBC, CNN, AP News).

ඒ සම්බන්ධයෙන් වාර්තා කරන සති අග අරුණ (ජනවාරි 14, 2024), එම පුවතෙහි සිරස්තල සහ උපසිරස්තල යෙදී ඇත්තේ මෙසේය.

* සිරස්තලය: "ප්‍රංශයේ අලුත් අගමැති 'මැක්‍රෝන්ගේ කොලුවා'(උපසිරස්තලය: "වයස තිස්හතරයි, සමරිසියෙක්")

මේ සම්බන්ධයෙන්ම වාර්තා කරන BBC පුවත් සේවය, ඒ සඳහා මෙවැනි සිරස්තලයක් යොදා ගනී.

* සිරස්තලය: "Gabriel Attal: Macron's pick for PM is France's youngest at 34" (පරි: "ගේබ්‍රියල් අතාල්: අගමැති ධූරයට මැකෝන්ගේ තේරීම වූ 34 හැවිරිදි ප්‍රංශයේ ලාබාලතම අගමැති")

ඒ අනුව, BBC සිරස්තලය හා සසඳන විට, මෙම සති අග අරුණ සිරස්තලය සහ උපසිරස්තලය පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

මූලාශ්‍ර:

https://apnews.com/article/france-gabriel-attal-prime-minister-macron-bourne-aba73836c839cbbb50839a2d1470ded3

https://edition.cnn.com/2024/01/09/europe/gabriel-attal-french-prime-minster-intl/index.html

https://www.bbc.com/news/world-europe-67922062

